**මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය**
**நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு**
**MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES**


මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව | செயலகம், கொழும்பு 01. இலங்கை. | The Secretariat, Colombo 01. Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.:
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2024.09.02

මාධ්‍ය නිවේදනය

## 2015 සිට 2022 දක්වා කාලය තුළ ව්‍යාපෘති සඳහා වූ රජයේ ණය ගැනීම් ගිණුම්ගත කර නැතැයි සඳහන් කරමින් පළ වූ පුවත් පත් වාර්තා පිළිබඳ පැහැදිලි කිරීම

2024 අගෝස්තු 29 වන දින පැවති ශ්‍රී ලංකාවේ ආර්ථික ඉදිරි මඟ පිළිබඳ විවාදය මත පදනම්ව පුවත් පත්වල පළ වූ ඇතැම් ලිපිවල *" 2015 සිට 2022 දක්වා කාලය තුළ රජයේ ව්‍යාපෘති සඳහා රුපියල් ට්‍රිලියන 8 ක ණය ලබාගෙන ඇති අතර, ඉන් 75% ක් ගිණුම්ගත කර නොමැත "* යනුවෙන් ප්‍රකාශ වී ඇත. මේ සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ පැහැදිලිකිරීම් පහත පරිදි වේ.

2023 වර්ෂය සඳහා රජයේ මූල්‍ය ප්‍රකාශන යටතේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ව්‍යාපෘති ණය ලෙස රුපියල් 7,301,756,109,116 ඇතුළත් වේ. (2022 වර්ෂය සඳහා සංසන්දනාත්මක අගය රුපියල් 7,665,018,983,131) එය ව්‍යාපෘති සඳහා ලබාගෙන නොපිය වූ මුළු ණය ප්‍රමාණය[1] වන අතර, එසේ ලබාගත් සෑම ව්‍යාපෘති ණයක් සඳහාම සවිස්තරාත්මක සටහනක් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ 2023 වර්ෂයේ අවසාන අයවැය තත්ත්ව වාර්තාවේ සටහන් අංක 24(II)[2] ලෙස හෙළිදරව් කර ඇත.

මේ අතර, රජයේ මූල්‍ය ප්‍රකාශන මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ 2023 වර්ෂයේ අවසාන අයවැය තත්ත්ව වාර්තාවේ IV වන කොටසේ ප්‍රකාශයට පත් කර ඇති අතර, මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපති වාර්තාව ද ඒ සමඟ ප්‍රකාශයට පත් කර ඇත[3].

---

[1] මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ 2023 වර්ෂය සඳහා අවසන් අයවැය තත්ත්ව වාර්තාවේ 265 පිටුව බලන්න
https://www.treasury.gov.lk/api/file/540b39f3-f2fa-49e7-bd2a-68d0d7d58634

[2] මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ 2023 වර්ෂය සඳහා අවසන් අයවැය තත්ත්ව වාර්තාවේ 268 සිට 292 පිටුව දක්වා බලන්න
https://www.treasury.gov.lk/api/file/540b39f3-f2fa-49e7-bd2a-68d0d7d58634

[3] මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ 2023 වර්ෂය සඳහා අවසන් අයවැය තත්ත්ව වාර්තාවේ 218 පිටුව බලන්න
https://www.treasury.gov.lk/api/file/540b39f3-f2fa-49e7-bd2a-68d0d7d58634

එම වාර්තාවේ විගණකාධිපති විසින් පෙන්වා දී ඇත්තේ *"2023 වර්ෂයේ දී රාජ්‍ය ආයෝජන වශයෙන් රුපියල් බිලියන 932 ක් උපයෝජනය කර තිබුණි. 2023 වර්ෂයේ රාජ්‍ය ආයෝජන රුපියල් බිලියන 932 ක ප්‍රමාණය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත මුදල් ප්‍රවාහයේ මුදල් වැය කිරීම් යටතේ භෞතික වත්කම් ඉදිකිරීම හෝ මිලදී ගැනීම හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම් ලෙස දක්වා තිබුණි. 2006 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා රාජ්‍ය ආයෝජන වශයෙන් එකතුව රුපියල් බිලියන 10,145 ක ප්‍රමාණය මුදල් ප්‍රවාහ ප්‍රකාශවල භෞතික වත්කම් ඉදිකිරීම හෝ මිලදී ගැනීම හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම් ලෙස දක්වා තිබුණි. නමුත්, 2023 වර්ෂයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ මූල්‍ය නොවන වත්කම් වශයෙන් ඉන් රුපියල් බිලියන 2,537 ක් පමණක් වත්කම් වශයෙන් හඳුනාගෙන ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව, මුදල් ප්‍රවාහ ප්‍රකාශවල සඳහන් කර තිබුණු භෞතික වත්කම් ඉදිකිරීම හෝ මිලදී ගැනීම හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම්වල එකතුව වූ රුපියල් බිලියන 10,145 න් රුපියල් බිලියන 7,608 ක් හෙවත් සියයට 75 ක් වටිනා වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට අපොහොසත් වී තිබුණි "*[4] යනුවෙනි.

**ව්‍යාපෘති ණය හරහා උත්පාදනය වන වත්කම්වලින් බහුතරයක් අදාළ රජය සතු ව්‍යවසාය (SOEs) හෝ එම වත්කම් නඩත්තු කරන ලබන රාජ්‍ය ආයතනවල ශේෂ පත්‍රවල ඇතුළත් වේ.** උදාහරණයක් ලෙස, අධිවේගී මාර්ග, මහාමාර්ග සහ පාලම් සම්බන්ධ වත්කම් මාර්ග සංවර්ධන අධිකාරියේ (RDA) ශේෂ පත්‍රයේ පිළිඹිබු වන අතර, ජලසම්පාදන හා ජලාපවහන සම්බන්ධ වත්කම් ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ශේෂ පත්‍රයේ පිළිඹිබු වේ. **එබැවින්, එම රජය සතු ව්‍යවසායවල ශේෂ පත්‍රවල දක්වා ඇති වත්කම් රජයේ මූල්‍ය ප්‍රකාශනවල පිළිඹිබු නොකිරීම තුළින් අදාළ වත්කම් ද්විත්ව ගණනය වීම වළක්වා ඇත.** උදාහරණයක් ලෙස මහා භාණ්ඩාගාරයෙන් 2018 සිට 2022 දක්වා වසර පහක කාලය තුළ ව්‍යාපෘති ණය මගින් මූල්‍යකරණය කරන ලද, මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ සම්පූර්ණ කරන ලද සහ දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති පිළිබඳ විස්තර සහ එම ව්‍යාපෘති ණය භාවිත කරමින් උත්පාදනය කරන ලද වත්කම් (සම්පූර්ණ කරන ලද වත්කම් සහ ඉදිකරමින් පවතින වත්කම්) ඇමුණුම I හි සඳහන් වේ.

**තව ද, රජයේ මූල්‍ය ප්‍රකාශනවල ණය ශේෂයන් සඳහන් වනුයේ ණය ආපසු ගෙවීම් සහ විනිමය අනුපාත වෙනස්කම් සඳහා ගැලපීමෙන් පසුව වන අතර, වත්කම් අගයයන් සටහන් වනුයේ ණය ලබාදෙන අවස්ථාවේ පැවති විනිමය අනුපාතිකයට අනුකූලවය.**

**එමෙන්ම, සියලුම ණය ගැනීම් වත්කම් නිර්මාණය කිරීම සඳහා යොදා නොගැනෙන අතර ඉන් කොටසක් පුනරාවර්තන වියදම් සඳහා ද භාවිත විය හැක.** උදාහරණයක් ලෙස, භාණ්ඩ ප්‍රසම්පාදනය, උපදේශනය, ප්‍රසම්පාදන සූදානම් ක්‍රියාකාරකම් යනාදිය ද මෙම සංඛ්‍යාවට ඇතුළත් වන අතර ඒවා වත්කම් අගයෙහි නිශ්චිතව පිළිඹිබු නොවේ.

මෙම පසුබිම සැලකිල්ලට ගනිමින්, විගණකාධිපති විසින් මතුකරන ලද කරුණට විසඳුමක් ලෙස රජයේ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීමේ සටහනක් ලෙස වර්ෂය තුළ ලබා දී ඇති ව්‍යාපෘති ණය සහ ප්‍රාග්ධනීකරණය කරන ලද වත්කම් පිළිබඳ වාර්ෂික සැසඳුම් ප්‍රකාශයක් ඇතුළත් කිරීමට තීරණය කරන ලදී[5].

---

[4] **මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ 2023 වර්ෂය සඳහා අවසන් අයවැය තත්ත්ව වාර්තාවේ 351 පිටුවෙන් ආරම්භ වන විගණකාධිපති වාර්තාවේ 24 පිටුවේ 4.5 කොටස - "රජයේ ආයෝජන" බලන්න**
https://www.treasury.gov.lk/api/file/540b39f3-f2fa-49e7-bd2a-68d0d7d58634

[5] **මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ 2023 වර්ෂය සඳහා අවසන් අයවැය තත්ත්ව වාර්තාවේ 325 පිටුවෙන් ආරම්භ වන උපලේඛන VI යටතේ වන 2023 වර්ෂය තුළ ලබා දී ඇති විදේශ ණය හරහා ජනනය කරන ලද වත්කම් ප්‍රකාශය බලන්න**
https://www.treasury.gov.lk/api/file/540b39f3-f2fa-49e7-bd2a-68d0d7d58634

Annex 1

## Details of the Projects Completed / Ongoing for the Last Five Years (2018-2022) financed by Foreign Loans from the General Treasury and Project Loans under the RDA

**Name of the Ministry:** ***Mnistry of Transport & Highways***

**Name of the State Owned Enterprise:** ***Road Development Authority***

| Ser. No | Name of the Projet | Loan Key | Type of Assets Generated | Completed/ Ongoing Yes/No | Total value of the Foreign Disbursements upto 31.12.2022 (Rs.) | Total value of the GOSL Funds released up to 31.012.2022 (Rs.) | SOEs Own Funds (Rs.) | Loans - Local Bank (Rs.) | Total Cost of the Project upto 31.12.2022 (Rs.) | If not capitalised, reason for the same | Accounting Treatment used in the Balance sheet of SOE for the loans provided by Treasury to generate assets |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | Outer Circuler Highway Phase I | 2007004 | Expressway | Completed | 27,785,482,671.72 | 6,345,109,464.08 | - | - | 31,502,226,549.84 | Capitalized | Assets (Expressways/Roads/Bridges/Land/Buildings) - Debit<br>Capital Grant - Credit |
| 2 | Outer Circuler Highway Phase II | 2008012<br>2011003 | Expressway | Completed | 46,371,946,583.42 | 1,492,526,008.74 | 40,000,000.00 | - | 47,904,472,592.25 | Capitalized | |
| 3 | China Development Bank Funded Priority Road Project II | 2011007 | Roads | Completed | 64,511,310,072.32 | 7,090,017,755.38 | 2,900,060,182.39 | - | 74,501,388,010.09 | Capitalized | |
| 4 | Southern Transport Development Project | 1999057<br>2001045<br>2011005<br>2011006 | Expressway | Completed | 81,844,380,250.29 | 38,011,823,313.77 | 87,653,198.60 | - | 119,943,816,762.66 | Capitalized | |
| 5 | Reconstruction of Kochchikade Bridge | 2016001 | Bridge | Completed | 1,550,408,348.02 | 158,250,000.00 | - | - | 1,708,658,348.02 | Capitalized | |
| 6 | National Highways Sector Project | 2006003 | Highways | Completed | 18,200,747,120.89 | 9,628,595,556.46 | - | - | 27,829,342,677.35 | Capitalized | |
| | National Highways Sector Project (Additional Financing) | 2011035 | Highways | Completed | 10,441,289,645.10 | 6,949,105,803.69 | 258,507,839.36 | - | 17,648,903,288.15 | Capitalized | |
| 7 | Constructions of Three Flyovers at Rajagiriya ,Polgahawela & Ganemulla | 2015032 | Flyovers | Completed | 8,905,520,743.13 | 788,984,758.48 | - | - | 9,864,783,282.64 | Capitalized | Assets (Expressways/Roads/Bridges/Land/Buildings) - Debit<br>Capital Grant - Credit |
| 8 | Reconstruction of 46 of Steel Bridges on National Roads with Freanch Assistance | 2012028 | Bridges | Completed | 3,781,113,093.86 | 3,390,725,603.56 | 19,911,765.45 | - | 7,191,750,462.87 | Capitalized | |
| 9 | China Development Bank Funded Priority Road Project III (Phase I) | 2014001 | Roads | Completed | 43,852,696,937.50 | 8,251,428,369.21 | 690,505,855.17 | - | 52,798,137,501.88 | Capitalized | |
| 10 | China Development Bank Funded Priority Road Project III (Phase II) | 2014034 | Roads | Completed | 16,329,575,771.30 | 3,062,738,113.66 | - | - | 19,392,313,884.96 | Capitalized | |
| 12 | Major Bridges Construction Project | 2013018 | Bridges | Completed | 10,469,366,861.36 | 913,371,777.11 | - | - | 11,382,721,491.17 | Capitalized | |
| 13 | Regional Bridges Project - Phase II (UK Steel Bridge) | 2013027 | Bridges | Completed | 9,355,626,957.84 | 2,491,673,085.55 | 327,000,000.00 | - | 12,184,254,745.94 | Capitalized | |
| 14 | Road Sector Assistance Project | 2006020 | Highways | Completed | 29,946,751,548.47 | 8,252,431,721.57 | - | - | 37,049,183,269.90 | Capitalized | |
| 15 | Outer Circuler Highway Phase-Phase III | 2014024 | Highways | Completed | 62,702,042,137.35 | 11,499,332,248.07 | 426,447,670.77 | 1,346,851,348.26 | 78,776,417,130.63 | Capitalized | |
| 16 | Nothern RoadConnectivity Project | 2012029<br>2012030 | Road | Completed | 25,064,510,814.74 | 330,504,418.64 | - | - | 25,394,803,100.03 | Capitalized | |
| 17 | Extension of Southern Expressway Project Section I | 2014040 | Expressway | Completed | 111,741,274,403.74 | 25,221,785,621.89 | - | - | 140,427,277,599.90 | Capitalized | |
| 18 | Extension of Southern Expressway Project Section II | 2016015 | Expressway | Completed | 49,252,441,051.09 | 2,063,680,667.21 | - | 7,517,722,171.20 | 58,838,375,565.81 | Capitalized | |
| 19 | Extension of Southern Expressway Project Section III | 2014036 | Expressway | Completed | 39,647,317,173.92 | 1,212,589,727.97 | - | 137,417,530.50 | 40,997,354,133.23 | Capitalized | |
| 20 | Extension of Southern Expressway Project Section IV | 2014025 | Expressway | Completed | 49,785,017,028.35 | 70,815,486.45 | 258,713,682.28 | 101,163,982.02 | 50,359,250,372.06 | Capitalized | |
| 21 | New Bridge Construction Project Over the Kalani River | 2014003 | Bridge | Completed | 87,036,260,825.00 | 2,209,729,509.04 | 439,815,413.54 | - | 93,360,794,219.37 | Capitalized | |
| 22 | Landslide Disaster Protection Project of the National Road Network Project | 2013019 | Road Infastructures | Completed | 9,677,850,764.89 | 1,580,023,414.27 | - | - | 11,333,693,283.96 | Capitalized | ildings) - Debit<br>Capital Grant - Credit |
| 23 | Southern Roads Connectivity Project | 2014017 | Roads | Completed | 23,685,388,807.00 | 10,676,695,203.80 | 1,342,319,388.06 | - | 36,208,046,947.06 | Capitalized | |
| 24 | Reconstruction of 25 Bridges | 2014002 | Bridges | Incomplete | 3,494,242,650.89 | 242,042,313.20 | 1,950,810.09 | - | 4,002,403,560.21 | Rs.1,552,573,258.46 has been capitalized & transferred to RDA | |
| 25 | Central Expressway Project -section I | 2019015 | Expressway | On going | 13,266,876,351.48 | 6,844,888,379.11 | 400,000,000.00 | 38,260,959,980.77 | 65,862,568,436.14 | Not capitalized since on going project | |

| Ser. No | Name of the Projet | Loan Key | Type of Assets Generated | Completed/ Ongoing Yes/No | Total value of the Foreign Disbursements upto 31.12.2022 (Rs.) | Total value of the GOSL Funds , , released up to 31.012.2022 (Rs.) | SOEs Own Funds (Rs.) | Loans - Local Bank (Rs.) | Total Cost of the Project upto 31.12.2022 (Rs.) | If not capitalised, reason for the same | Accounting Treatment used in the Balance sheet of SOE for the loans provided by Treasury to generate assets |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 26 | Inclusive Connectivity and Development Project | 2021032 | Roads | On going | 5,973,985,608.83 | 47,830,403.00 | - | - | 4,616,357,135.10 | Not capitalized since on going project | Assets (Expressways/Roads/Bridges/Land/Bu |
| 27 | Kandy Multimodal Transport Terminal Development Project | 2021016 | Transport Terminal | On going | 169,468,806.09 | 17,096,309.58 | - | - | 35,260,738.90 | Not capitalized since on going project | |
| 28 | Integrated Road Investment Program(I Road I) | 2014041<br>2015037<br>2015009<br>2017040<br>2015010 | Roads | On going | 187,063,371,633.93 | 665,137,673.96 | - | - | 185,575,413,340.05 | Rs.308,953,686.96 has been capitalized & transferred to RDA | |
| 29 | Second Integrated Road Investment , ProgramI(Road II ) | 2017037<br>2017036<br>4067<br>2019048 | Roads | On going | 187,626,039,484.19 | 89,300,000.00 | - | - | 182,744,306,712.22 | Not capitalized since on going project | - |
| 30 | Badulla Chenkaladi Road Improvement Project | 2015026<br>2015015 | Highways | On going | 13,269,670,471.04 | 2,958,673,968.47 | 2,538,312.37 | - | 17,536,107,438.36 | Not capitalized since on going project | - |
| 31 | Port Access Elevated Highways Project | 2019012 | Highways | On going | 40,264,261,658.41 | 515,728,421.66 | - | - | 42,634,106,513.33 | Not capitalized since on going project | - |
| 32 | Transport Connectivity and Asset Management Project | 2017023 | Technical Assistance | On going | 1,240,849,779.01 | 149,769,582.06 | - | - | 1,253,790,535.98 | Not capitalized since on going project | - |
| 33 | Transport Project Preparatory Facility Project | 2016035 | Technical Assistance/Co nsultancy | On going | 995,836,074.52 | 47,525,269.76 | - | - | 1,012,934,736.06 | Not capitalized since on going project | - |
| 34 | Exim Bank of China (Hunan Branch) Funded Widening & Improvement Of 64.31 Km Roads and Reconstruction 13 Bridges in Central And Uva Provinces | 2018022 | Roads & Bridges | On going | 14,070,365,472.89 | 420,945,326.16 | 1,901,424,348.42 | - | 14,252,186,655.53 | Not capitalized since on going project | - |
| 35 | Design & Construction of Kohuwala and Gatambe Flyovers | 2021001 | Flyovers | On going | 5,040,033,866.98 | 444,637,191.14 | - | - | 4,873,845,007.31 | Not capitalized since on going project | - |
| 36 | Saudi Funded Road Network Development Project | 2012025 | Highways | On going | 8,145,532,847.17 | 469,788,578.98 | 55,649,516.16 | - | 8,834,964,409.43 | Not capitalized since on going project | - |
| 37 | OPEC Funded Rehabilitation of A017 Road Corridor Project (Rakwana - Suriyakanda) | 2019045 | Highways | On going | 320,467,150.06 | 13,214,433.14 | - | - | 180,769,572.52 | Not capitalized since on going project | - |
| 38 | OPEC Funded Western Province Road Development Project | 2015014 | Highways | On going | 2,576,528,802.22 | 1,894,530,831.31 | 119,383,575.00 | - | 5,103,609,859.28 | Not capitalized since on going project | - |
| 39 | OPEC Funded Road Network Development Project | 2012024 | Highways | On going | 4,944,778,131.95 | 429,995,416.93 | 70,841,447.15 | - | 5,440,007,323.67 | Not capitalized since on going project | - |
| 40 | OPEC Funded Rehabilitation & Improvement of Colombo National Highways Project | 2013023 | Highways | On going | 6,694,322,940.95 | 9,146,991,642.74 | 1,478,049,914.66 | - | 19,241,017,155.44 | Not capitalized since on going project | - |

*Source. Road Development Authority*